# කොළඹ මහා නගර සභාව

**බස්නාහිර පළාත් සභාවේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ ගිනිභට (Fireman) තනතුර සඳහා විවෘත බඳවා ගැනීම**

කොළඹ මහා නගර සභාවේ ගිනිභට තනතුරු 35 ක පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය :- බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම සේවයේ ගිනිභට තනතුර (Fireman)

02. මාසික වැටුප් ප්‍රමාණය :- RS 1- (රා.ප.ච 10 /2025 අනුව)
රු. 49,550- 7 X 540 -27 X670 -71,420

**03. වයස් සීමාව** :- අවුරුදු 18 නොඅඩු හා අවුරුදු . 24 නොවැඩි

**04. අධ්‍යාපන සුදුසුකම්** :- එක් වරකදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගය විෂයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයන්ද සමත්ව තිබිය යුතුය

**05.කායික සුදුසුකම්**

- උස සෙ.මී 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය(ජෛව ස්කන්ධ දර්ශකය18.5 සිට 24 දක්වා විය යුතුය.
- සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර වර්ණ පෙනීම ද සමාන්‍ය විය යුතුය.
- කෘත්‍රිම ශාරිරික වෙනස්කම් කර නොතිබිය යුතුය (පච්ච කොටාගැනීම වැනි)

06. වෙනත් සුදුසු කම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය .
- අවිවාහක පිරිමි අයකු විය යුතුය
- යහපත් චරිතයකින් යුක්තවිය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**07. බඳවා ගැනීමේ ගැනීමේ ක්‍රමය :-**

I. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තිය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිභට වශයෙන් තෝරාගනු ලැබේ .

II. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිභටයන් කායික, මානසික, යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

III. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාල සීමාව තුළදී වැඩ,හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

IV. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරව බඳවාගනු ලැබේ. පුහුණු කාල සීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර, අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

V. පුහුණු කාල සීමාව තුල මාසිකව රු 10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

VI. පුහුණු කාල සීමාව තුළදී කිසිම ආධුනික ගිනිභටයකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

VII. පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 කාල සීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්වීම් බලධාරියා සමඟ රු.500,000/- ක වටිනාකමකින් යුත් බැඳුම්කරයක් පුහුණුව ආරම්භකරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

VIII. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුල පුහුණුවෙන් ඉවත්වන්නේ නම් පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

IX. ගිනිභට තනතුර සඳහා පත්වීම් ලැබූ පත්වීම්ලාභීන්ට කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කල හැකිය.

**08. තනතුරුවල ස්වභාවය**

❖ මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව අනාගතයේදී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

❖ වැන්දඹු අනන්දරු හා වැන්දඹු පුරුෂ අනන්දරු අරමුදල් සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

❖ මෙම බඳවා ගැනීම් ස්ථිර පදනම මත සිදු කරන අතර, කොළඹ මහා නගර සභාව මඟින් ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

❖ අයදුම්කරුවන් පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව A 4 ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිලියෙල කර ගත් අයදුම්පත් **"නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07"** යන ලිපිනයට 2026.03.20 වන දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ආධුනික ගිනිභට තනතුර සඳහා "** ලෙස සඳහන් කළ යුතුය.

❖ මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර නියමිත දිනෙන් පසුව ලැබෙන හා සුදුසුකම් සපුරා නොමැති අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධාරීයා සතුවේ.

2026.02 .

පාලිත නානායක්කාර,
නාගරික කොමසාරිස්,